# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1899/32 - 2015 ජනවාරි මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2015.01.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2015 ජනවාරි මස 30 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2014.10.24 දිනැති අංක 1885/47 දරන අති විශෙෂ ගැසට් පත්‍රය, මගින් උඳු (සංයෝජිත වර්ගීකරණ අංක 0713.31.29) සහ 2014.12.02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් උම්බලකඩ, හාල්මැස්සන්, මුං ඇට, මිරිස් , කොත්තමල්ලි, කහ, උඳුපිටි, ටින් මාළු, සීනි (සංයෝජිත වර්ගීකරණ අංක 0305.59.10, 0305.59.20, 0713.31.19, 09.04, 09.09, 09.10, 1106.10.10, 16.04, 17.01) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2015 ජනවාරි මස 30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 1. | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි. ග්‍රෑමයට රු. 102.00 |

1A - PG 2350 — 502 (2015/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 2. | | 0305.59.20 | වියලූ, ලුණු නොදැමූ, හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 11.00 |
| 3. | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි.ග්‍රෑමයට රු. 10.00 |
| 4. | | 0713.31.29 | අනෙකුත් - උඳු | කි.ග්‍රෑමයට රු. 60.00 |
| 5. | 09.04 | 0904.21.10 | මිරිස් - වියලි, කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 25.00 |
| | | 0904.22.10 | මිරිස් - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125.00 |
| | | 0904.22.90 | අනෙකුත් - කුඩුකළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125.00 |
| 6. | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 26.00 |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 52.00 |
| 7. | 09.10 | 0910.30.10 | කහ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 102.00 |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 360.00 |
| 8. | 11.06 | 1106.10.10 | උඳුපිටි | කි.ග්‍රෑමයට රු. 200.00 |
| 9. | 16.04 | 1604.11 | සැමන් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.12 | හුරුල්ලන් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයේ) | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.15 | මැකරල් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.16 | ඇන්චෝවිසි | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.17 | ආඳන් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.19 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි.ග්‍රෑමයට රු. 50.00 |
| 10. | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු නොවූ ශුද්ධ නොකළ සීනි | |

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| | | 1701.12 | බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701-13 | උක් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.14 | අනෙකුත් උක් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | | අනෙකුත් | |
| | | 1701.91 | එකතු කරන ලද රස කාරක හෝ වර්ණක අඩංගු | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.91.10 | සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.91.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.99 | අනෙකුත් | |
| | | 1701.99.10 | සුදු ස්ඵටිකකෘත උක් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.99.20 | සුදු ස්ඵටිකකෘත බීට් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.99.30 | අනෙකුත් සීනි | කි.ග්‍රෑමයට රු. 18.00 |
| | | 1701.99.90 | අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 18.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.